## 1.1 හැඳින්වීම

සන්නිවේදන මාධ්‍ය අතුරින් මිනිසාට වඩාත් සමීපතම මාධ්‍යය වනුයේ රූපවාහිනිය යි. සන්නිවේදනය යන විෂය, දියුණුවට පත්වීමත් සමග'ම රූපවාහිනිය යන ඉලෙක්ට්‍රොනික මාධ්‍යය බහුතර ජනතාවකට ළගා වීමට අදහසාගේ දී සමත් වී තිබේ. රූපවාහිනිය ශ්‍රව්‍ය හා දෘශ්‍ය යන මාධ්‍ය ද්විත්වය ම ප්‍රේක්ෂකයාට එකවර ලබාදීම සුවිශේෂිත යි. අසූව දශකයේ මුල් භාගයේ ශ්‍රී ලංකාව තුළ ප්‍රතිස්ථාපනය වන රූපවාහිනිය, වර්තමානය වන විට අධ්‍යාපනික හා විනෝදාත්මක යන අංශයන්ගෙන් ප්‍රේක්ෂකයාට වඩාත් සමීප ඇත.

රූපවාහිනිය ශ්‍රී ලාංකේය ප්‍රේක්ෂකයාට නව අත්දැකීමක් විය. ගුවන් විදුලිය මෙන්ම ජනතාවගේ ප්‍රභල සන්නිවේදකයා වූ අතර, රූපවාහිනතයට යොමුවන්නන් ද ගුවන් විදුලි නිර්මාණ කාර්යයේ නිරත වූ සම්පත් දායකයින් ය. අපටම ආවේණික වූ රූපවාහිනී සම්ප්‍රදායක් බිහිකර ගැනීම පිළිබඳව එදා නිර්මාණකරුවන්ගේ උත්සාහය විය.

විදේශීය වැඩසටහන් ඇසුරින් මෙරට රූපවාහිනිය තුළ දැකගත හැකි විය. අපට උරුම සංස්කෘතික කරුණු හා සංස්කෘතික අංගයන් රූපවාහිනී වැඩසටහන් ඇසුරෙන් ගොඩනගා ගැනීමට සුදුසු බව නවක රූපවාහිනී නිර්මාණකරුවන්ට එදා අවබෝධ විය.

අසූව දශකයේ මුල් භාගයේ දරණ ලද මෙවැනි උත්සාහයන් කාලයාගේ ඇවෑමෙන් අත්හැරිය ලද අතර, අදපහත රූපවාහිනී වැඩසටහන්වල අනන්‍යතාවය පිළිබඳව වඩා අර්ථික වටිනාකම් පසුපස හඹායන තත්ත්වයක් විද්‍යාමාන වේ. රූපවාහිනිය අද ඒකාදිකාරිත්වයෙන් මිදී තිදහසේ ගලායන තත්ත්වයක් පෙන්නුම් කරයි.

රූපවාහිනිය තුළින් විනෝදාස්වාදය සැපයීම බහුතර ජනතාව බලාපොරොත්තු වන්නෙකි. රූපවාහිනී මාධ්‍යය තුළින් ඉදිරිපත් කැරෙන වැඩසටහන් අතර ටෙලි නාට්‍යය, වාර්තා වැඩසටහන් හා සංගීත වැඩසටහන් හා ප්‍රසංගික වැඩසටහන් බහුතර ප්‍රේක්ෂක ආකර්ෂණය දිනාගැනීමට වර්තමානය දී සමත්ව ඇත. මෙහිදී අප මූලිකවම සතා කරනු ලබන්නේ නාට්‍යකය යන විෂය පිළිබඳවයි.

නර්තනය යනු සජීවී කලා මාධ්‍යයකි. සන්නිවේදනය නම් පුළුල ක්‍රියාවලිය ඉතිහාසයේ මුලාරම්භයේ සිටම නර්තනයට වගකිව යුතුව ඇත. විනෝදාස්වාදය මුල්කරගත් මෙම සජීවී මාධ්‍යය ශ්‍රව්‍ය හා දෘශ්‍ය කැටිකොට ගත් රූපවාහිනිය වැනි ඉලෙක්ට්‍රොනික මාධ්‍යයකට ගෙන ඒම සංකීර්ණ තත්ත්වයකි. ගෙපැලේ, කමතේ, වේදිකාවේ දෙඇස් ඉදිරිපිට එළිදක්වන ලද්දකි, නර්තනය.

රූපවාහිනී කැමරාවෙන් ග්‍රහණය කරගන්නා දර්ශන සංස්කරණ ක්‍රියාවලියකට භාජනය කොට ද්විමාන තලයක් මතට ගෙන ඒම රූපවාහිනී ක්‍රියාදාමයේ දී සිදුවන්නකි. ත්‍රිමාණව අප දකින නර්තනාංගය ද්විමාන තලයකට ගෙන ඒමේදී සිදුවන පරිනාමය පිළිබඳව සොයා බැලීම වටී.

කමතේ, ගෙපැලේ අප දෙනෙත් ඉදිරිපිට මැවෙන සුන්දර නර්තන වින්‍යාසය රූපවාහිනී වැඩසටහනකට දායක වන කිහිප දෙනෙකුගේ ඇසින් බහුතරයකට ඉදිරිපත් කරන විට ඇතිවන සංවේදී භාවය නිසා සිදුවන බාධාවන් මෙහි දී වළක්වාගත යුතු ය. රූපවාහිනී වැඩසටහන් අධ්‍යක්ෂක, කැමරා අධ්‍යක්ෂක, ආලෝකකරණ ශිල්පීන්, සංස්කරණ ශිල්පීන් හා නර්තන ශිල්පීන්ගේ එකමුතුවෙන් නර්තන වැඩසටහන් නිර්මාණය වේ.

තිරය මතුපිටට ගෙනෙන රූපාවලිය තීරණය වන්නේ කැමරාවේ ගොඩනගන රූපරාමු අනුවයි. එක් කැමරාවක් හෝ කැමරා කිහිපයක් එකමුතුව සාදන රූප රාමු පෙළ අවසානයේ නර්තනාංගය ද්විමාන තලයකට දිගහරී. නර්තනාංගයක් රූපවාහිනියට ගෙනඒමේදී කැමරාව ගොඩනගන රූපරාමුවෙහි ගුණාත්මකභාවය හා එහි ප්‍රකාශනාත්මක ශක්තිය නර්තනාංගය කෙරෙහි බලපෑමු ලබයි. කැමරාව ගොඩනගන රූපරාමු මෙන්ම, ඒ සමගම පසුතලය, ආලෝකකරණය, සංස්කරණය යන අංශයන්හි සංයෝජනයෙන් ගොඩනගන ලද සංරචනයද වැදගත් වේ. මෙය අප රූප සංරචනය (Picture composition) යන නමින් හඳුන්වමු.

තාක්ෂණය කොපමණ ඉහළ මට්ටමකින් යුක්තව රූපවාහිනී වැඩසටහන් නිර්මාණය කෙරුවද එහි නිර්මාණශීලීභාවය නොමැති නම් එහි විපුල ඵල ලබා ගැනීමට නොහැකි වේ. නර්තනාංගයක දී වුවද නිවැරදි ලෙස නර්තනාංගයේ රූප රාමු ගොඩනගා ගැනීමට නොහැකි වුවහොත් සමස්ත ප්‍රතිඵලය ම අසාර්ථක වීමට ඉඩ ඇත.

වර්තමානයේ ශ්‍රී ලංකාව තුළ විකාශනය වන රූපවාහිනී වැඩසටහන් මෙය පිළිබඳව සැළකිල්ලක් නොදක්වන බව විද්‍යමාන වේ. කැමරාවට අවශ්‍යය පරිදි නර්තනාංගය හා අනෙකුත් අවශේෂ අවශ්‍යතාවයන් සකසා ගෙන රූප ගත කිරීමක් අපට ගම්‍යමානය. නමුත් සිදුවිය යුත්තේ නර්තනාංගයේ ජීව ගුණය හා එහි ප්‍රාසාංගික බව යන දෙඅංශයම ප්‍රේක්ෂකයා ඉදිරියට ගෙන ඒමයි. එහිදී කැමරාව නර්තනය වෙතට ගෙන යා යුතුය.

රූපවාහිනිය නර්තන ප්‍රේක්ෂකයන්ගේ විඥ්ඥානය එකිනෙකට පරස්පර වේ. ඒ ඒ විඥ්ඥාන මට්ටමට ගැළපෙන පරිදි වැඩසටහන් නිර්මාණය අභියෝගාත්මක කටයුත්තකි. ඒ අනුව මෙම නිබන්ධය තුළින් අප සාකච්ඡා කරනුයේ නර්තන වින්‍යාසයක් රූපවාහිනියට ගෙන ඒමේදී කැමරාව සාර්ථක ලෙස හසුරුවන්නේ කෙසේද යන්න සොයා බැලීමයි. එහිදී අද්‍යතනයේ දී විකාශනය වන රූපවාහිනී වැඩසටහන් පිළිබඳව විමර්ශනයක යෙදෙමින් නර්තනය රූපවාහිනියට ගෙන ඒමේදී කැමරාව කෙසේ හැසිරවිය යුතු ද යන්න පිළිබඳව යෝජනාවක් ඉදිරිපත් කිරීමට ද බලාපොරොත්තු වෙමි.